# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2329/20 - 2023 අප්‍රේල් මස 25 වැනි අඟහරුවාදා - 2023.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානයේ වාර්ෂික පෙරහැර

වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති 1948 සැප්තැම්බර් 10 දාතම අංක 9902 *ගැසට් පත්‍රයේ* ද, 1951 අගෝස්තු 17 දාතම අංක 10283 *ගැසට් පත්‍රයේ* ද, 1955 මාර්තු 25 දාතම අංක 14778 *ගැසට් පත්‍රයේ* ද, 1992 අංක 58 බලතල පැවරීම (ප්‍රාදේශීය ලේකම්වරු) පනත අනුව, 2011.06.10 වැනි දින අංක 1710 දරන *ගැසට් පත්‍රයේ* ද පළවූ බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානයේ (වාර්ෂික පෙරහැර) පිළිබඳ ව්‍යවස්ථාව අනුව ද බදුල්ල ප්‍රාදේශීය ලේකම් ඩී. එම්. එල්. එච්. දිසානායක වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2023 වර්ෂයේ බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානයේ පෙරහැර සම්බන්ධයෙන් පහත නියෝග පනවමි.

01. 2023 මැයි මස 04 වැනි දින ඇතුල් පෙරහැර මංගල්‍යය ආරම්භ වී 2023 මැයි මස 05 වැනි දින පෙරහැර වීදි සංචාරය කර, මුතියංගණ විහාරස්ථානයට ගෙවැදීමෙන් පසු පෙරහැර අවසන් වන බව දනුම්දෙමි.

02. පෙරහැරේ ගමන් මාර්ගය :

2023 මැයි මස 04 වැනි දින ඇතුල් පෙරහැර මංගල්‍යය පෙරහැර පිටත්වීම - රාත්‍රී 7.25 ට විහාරස්ථාන භූමිය තුළ පමණක් වීදි සංචාරය කිරීමට නියමිත ය.

2023 මැයි මස 05 වැනි දින රාත්‍රී 7.50 ට මුතියංගණ විහාරස්ථානයෙන් පිටත් වී දුම්රියපොල පාර, අනගාරික ධර්මපාල මාවත, පහළ රජ වීදිය, රජ වීදිය ඔස්සේ මුතියංගණ රාජමහා විහාරස්ථානයට ගෙවැදීමෙන් පසු පෙරහැර අවසන් වන බව දැනුම් දෙමි.

03. බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානය පිහිටි භූමිය යන ස්ථානයන් හා ඒ අවට ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම හා වෙළඳාම් කිරීම තහනම් කරමි.

04. පෙරහැර කාලය තුළ දී ප්‍රධාන මාර්ගවල පෞද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථ වාහන මගෙන් හෝ මුතියංගණ භාරකාර විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ බලපත්‍රයක් නොමැතිව විහාරස්ථාන භූමියට ඇතුළු කිරීම තහනම් කරමි.

1A - G 39385 — 08 (2023/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. පෙරහැර ගමන් ගන්නා මාර්ගයන් හි බදුල්ල මහ නගර සභාව මගින් විධිමත් අනුමැතියකින් ඉදිකරනු ලබන ගොඩනැගිලි හා දැනට ඇති ස්ථිර ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙඳුන් විසින් විහාරස්ථාන පෙරහැරින් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත්කර ගැනීමෙන් පසු පෙරහැර ගමන් ගන්නා මාර්ගය හා විහාරස්ථාන භූමිය තුළ පොලිතින් ඇතුළු සියලු ම අපද්‍රව්‍ය එකතුකර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතු ය.

06. මාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව පූජා භූමිය හා එහි අවට කිසිම තාවකාලික හෝ ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

07. කිසිවකු විසින් මාගේ හෝ බදුල්ල මහ නගර සභාව මගින් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නා වූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ පූජා භූමි ප්‍රදේශයක් තුළ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

08. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

09. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියකුගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් අංක 03 හි දක්වෙන කඳවුර ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

**ඩී. එම්. එල්. එච්. දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2023 අප්‍රේල් මස 04 වන දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04-0168

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.